Copyrighted Material

MELANIE GOLDING

# little darlings

# ලිට්ල් ඩාලින්ස්

MusesBooks®

පරිවර්තනය
**නිලන්ති එදිරිවීර**

MusesBooks
www.musesbooks.com

Copyrighted Material

**අගෝස්තු 17**
**පීක් දිස්ත්‍රික්කය – එක්සත් රාජධානිය**

රහස් පරීක්ෂක සැරයන් ජොආනා හාපර් අනෙකුත් පොලිස් නිලධාරීන්ද සමග පාරේ බෝක්කුව මත සිටගෙන සිටියාය. ජලාශයේ විශාල දියතලය හරහා වන ඈත ඉවුරේ, දියකඳ මායිමේ කාන්තාවක සිටියේ ජලාශයට බැසීමට සූදානමින් මෙන් ඇගේ නිවුන් දරුවන් දෙදෙනාව දෑතින් වඩාගෙන පොරොත්තුවෙමිනි.

හාපර් තම ප්‍රධානියා දෙසට හැරුණාය. "ඔෆිසර්ලා ඉන්නේ අර පැත්තට කොයිතරම් ළඟින්ද?"

කාන්තාව රැඳී සිටි වෙරළ තීරය ඝන වනාන්තරයකින් වටවී තිබේ. කටු අකුල්වල පැටලුණු ඇගේ දෙපා රුධිරයෙන් රතුවී ඇති බව මෙතරම් දුරක සිට පවා හාපර්ට දැකිය හැකි විය.

"ගොඩක්ම ළං වෙලා නෑ," ත්‍රප් කීවේය. "එයාගෙ ළඟට යන ක්‍රමයක් තවම හොයාගන්න බෑ."

ප්‍රකෝපකාරී හඬක් නංවන හෙලිකොප්ටරය ජලාශය කලඹවමින් ඔවුන්ගේ හිසට ඉහළින් සැරිසරන අතරම විධානය මොරගාන්නට විය. **වතුරෙන් ඈත්වෙන්න!** එය දරුණු ලෙස කන් බිහිරි කරවමින් මවගේ කුඩා රූපකායට ඉහළින් සැරිසැරුවද එතුළ වූ නිලධාරීන්ට ඈව නතර කළ නොහැකි විය. ආරක්ෂිත ලෙස යානය ගොඩබැස්සවීමට හෝ දඹරය පහළට දැමීමට ප්‍රමාණවත් ලෙස පහත් කිරීමට හෝ ඉඩක් මිටියාවතේ පෙනෙන්නට නොතිබිණි.

කාන්තාව දරුවන් අල්ලාගෙනම වියළුණු රොන් මඩ මත වාඩි වන ඉරියව්වකට ඇදවැටෙනු, ඇගේ මුහුණ අහස දෙසට යොමුවන අයුරු ඈ දෙස දුරදක්නය තුළින් බලා සිටි හාපර්ට පෙනිණ. සමහරවිට ඈ එය සිදු නොකරනවා විය හැක!

එවිටම ඇගේ මතකයට නැගුණේ මහලු කාන්තාව කී දෙයයි.

*"එයාට තමන්ගේ බබාලව ආපහු ඕනනම්, එයා උන්ව වතුරට දාන්න ඕන... කෙළින්ම ගඟ පතුලටම. ගඟේ ගිල්වාගෙනම ඉන්න ඕන!"*

කාන්තාව තවදුරටත් දියකඳ මායිමේ වාඩිවී සිටියේ නැත. තම දණහිස තරම් ගැඹුරට දියකඳේ ගිලී සිටි ඈය තවත් ඉදිරියට යමින් සිටියාය. පයින් ගසා තම පාවහන් ගැලවූ රහස් පරීක්ෂක සැරයන්වරිය අත්වැට ඉහළට නැග කිමිදීමට සැරසිණ.

Copyrighted Material



# 01

*The child is not mine as the first was,*
*I cannot sing it to rest,*
*I cannot lift it up fatherly*
*And bliss it upon my breast;*
*Yet it lies in my little one's cradle*
*And sits in my little one's chair,*
*And the light of the heaven she's gone to*
*Transfigures its golden hair.*

*From The Changeling by James Russell Lowell*[1]

MusesBooks®

**ජූලි** 13
**පස්වරු** 08:10

ඇ සැලකිලිමත් වූයේ වේදනාව ඉවත්වීම පිළිබඳව පමණි. ඒ සමඟම උදාවූ ආශ්චර්යමත් තත්පර කිහිපයකදී ඇ තුළ වූ බිය හා

1 පළමු දරුවා බඳුම මුත් මේ දරුවා මගේ නොවේ
ඔහු නැළවෙන තෙක් ගී ගැයීමට මට නොහැක
සෙනෙහෙබරව ඔහුව වඩාගැනීමට,
ළමැද අසලට ගෙන ප්‍රමෝදයට පත්කරවීමට මට නොහැක
එසේ වුවත් ඔහු මගේ කුඩා දරුවාගේ තොටිල්ලේ වැතිර සිටී
ඔහු මගේ කුඩා දරුවාගේ පුටුවේ වාඩිවේ
ඇ නික්ම ගිය ස්වර්ගයෙන් විහිදෙන ආලෝකය
ඔහුගේ රන්වන් කෙස් කලඹින් පිළිබිඹු වේ
*James Russell Lowell, The Poetical Works (Cambridge (Riverside, 1904)*, පළමු වෙළුම. *(The Complete Writings of James Russell Lowell*, නවවන වෙළුම), පිටු අංක 251-253

www.musesbooks.com

Copyrighted Material



තමා මියයනු ඇතැයි වූ නිසැක හැඟීම යන සියල්ල පහව ගියේය. ඇයට අවශ්‍ය වූයේ කෙටි නින්දකට වැටෙන්නටය. නමුත් එවිටම රෝහලේ භාවිත කරන කොළ පැහැ හිස්වැස්මක් පැලඳි පැට්‍රික්ගේ බියපත් මුහුණ මතුවිය. *මගේ ළමයි මගේ ළඟ ඉන්නවා*. ඇය සිහියට නඟාගත්තාය. ඇගේ කොඳුඇට පෙළට ලබාදුන් එන්නතෙන් ඇතිවුණු භයානක සංකෝචනය අවසන් වන සලකුණක් හෝ නොවීය. එමෙන්ම අඬු භාවිත කිරීමේ ක්‍රියාවලිය ආරම්භයේදී එය වැරදීමේ ඉඩකඩක්ද තිබිණ. පළමු දරුවා ගැබ් ගෙල තුළ සිරවී සිටියේය. එබැවින් හිරිවැටීම නම් වූ මහානුභාව සම්පන්න, උණුසුම් කෝෂය තුළ ගිලෙමින්, තමාට පැය තිස් හයකින් අත්විඳින්නට නොලැබුණු නින්ද වෙත එළැඹෙනු වෙනුවට ඈ උත්සාහ කළේ සිදුවන්නේ කුමක්ද යන්න පිළිබඳව සිත යෙදවීමටය.

ලෝරන්ගේ මුහුණ අසලින්ම වෛද්‍යවරියකගේ මුහුණක් මතුවිය. ඇගේ මුහුණේ හා නිකටේ වැඩි කොටසක් නිරාවරණය වන සේ මුව ආවරණය පහළට ඇද තිබිණ. ලෝරන්ට පෙනුණේ වෛද්‍යවරියගේ මුවින් නික්මෙන වචනවලට සම්බන්ධයක් නැති ආකාරයෙන් ඇගේ දෙතොල් සෙලවෙන බවකි. ඒ ඖෂධ හා වෙහෙස නිසා වන්නට ඇත. ලෝකය මන්දගාමීය. ලෝරන් නළල රැලි කරගත්තාය. වෛද්‍යවරිය ඈ දෙස බලා සිටියාය. නමුත් ලෝරන්ට පෙනුණේ ඈ ඉතා දුරින් සිටින බවකි. *එයා කතා කරන්නෙ මට. මම ඇහුම්කන් දෙන්න ඕන*. ලෝරන් සිතුවාය.

"හොඳයි ට්‍රැන්ටර් මහත්මිය, කොඳුඇට පෙළට දීපු බෙහෙත නිසා සංකෝචනය වෙන්නෙ කොයි වෙලාවෙද කියලා ඔයාට කියන්න බැරිවෙයි. ඒ නිසා ඔයා තල්ලු කරන්න ඕන වෙලාව මම කියන්නම්. හරිද?"

පිළිතුරු බැඳීමට ලෝරන්ගේ මුව රවුම් වූ නමුත් වෛද්‍යවරිය ඒ වන විටත් පිටවගොස් සිටියාය.

"තල්ලු කරන්න!"

ඇදීමේදී වෛද්‍යවරිය දැරූ බලය ඇයට දැනිණ. ඒ සමඟම ඇගේ මුළු සිරුරම ඇඳ දිගේ ලිස්සන්නට විය. තමා තල්ලු කරන්නේද නැද්ද යන්න ඇයට නිවැරදිව කිව නොහැකි විය. ඈ උත්සාහ කළේ තමා වෙහෙස දරන බව මුහුණෙන් නිරූපණය කිරීමටය. ඇය තම ගෙලෙහි මාංසපේශි තද කළාය. නමුත් ඒ සමඟම ඇගේ හිස තුළ වූ හඬක් ඇයව අමතන්නට විය. *මොකටද කරදර වෙන්නෙ? මම*

Copyrighted Material



*තල්ලු කළත් නැතත් ඒක එයාලට කියන්න පුළුවන්කමක් නෑ. එහෙම නේද? මට පොඩි නින්දක් දාන්න පුළුවන් වෙයි.*

ඇය දෑස වසාගත්තාය.

"දැන් තල්ලු කරන්න."

වෛද්‍යවරිය නැවතත් ඇද්දාය. පළමුවැන්නා පිටතට පැමිණෙන විටම ඇගේ ස්වප්නරූපී බව විසිරිණ. ලෝරන් දෑස විවර කළාය. සියල්ලක්ම යළිත් නාභිගතවෙමින්, සුපුරුදු වේගයෙන් නැතිනම් සමහර විට මඳක් වැඩි වේගයකින් කාලය දිවෙන බවක් පෙනිණ. හැඬුම් හඬක් බලාපොරොත්තුවෙන් ඇය තම හුස්ම අල්ලාගෙන සිටියාය. අවසානයේදී එය මතුවිය. දුර්වල අම්හිරි හඬක්. කම්පනයට එරෙහිව මතුකළ දුර්වල විරෝධයක්. ඇයටද හැඬුම් මතුවිය. දෑසින් කඳුළු පිටතට විදින්නාක් මෙනි. ඒවා පිරී තිබුණේ හැඟීම්වලිනි. පැට්‍රික් ඇගේ අත මිරිකුවේය.

"මට බලන්න දෙන්න," ඇය කීවාය. දරුවා මවගේ ළය මත තැබුවේ ඒ මොහොතේය. නමුත් ඒද ඔහුගේ පසුපස ඇයට හැරවෙන සේය. ලෝරන්ගේ නිකට අසල දරුවාගේ තට්ටම. ඇයට දැකිය හැකි වූයේ වියළී ගිය ශ්‍රාවයන් තැවරුණු දෙපා හා අවකාශයේ එහා මෙහා සැලෙන කුඩා අත පමණි. ඔවුන් දෙදෙනා වෙත නැමුණු පැට්‍රික් දරුවා දෙස ඇස් කොනින් බලා සිනාසෙමින් සහ ඉන්පසු හඬමින් කුඩා අත්ල මත ඇඟිල්ල තබා තද කරන්නට විය.

"ඔයාලා කාටහරි එයාව අනෙක් පැත්තට හරවන්න පුළුවන්ද?" ඇය විමසුවාය. නමුත් කිසිවෙක් එය ඉටුකළේ නැත. ඉන්පසු වෛද්‍යවරිය නැවතත් "තල්ලු කරන්න," යැයි පවසනු ඇයට යාන්තමින් ඇසිණ. තවත් ඇදීමක්. ඈ අසල සිටි පළමු දරුවාව ඉවතට ගෙන දෙවැන්නාව එතැන තබන ලද්දේය.

මෙවර නම් ඇයට එදෙසට සමීපව දරුවාගේ මුහුණ පෙනෙන සේ හරවාගත හැකි විය. දැත් එක්කොට සකසාගත් තොටිල්ලක දරුවා රඳවාගත් ඕ මඳ වේලාවක් ඒ මුහුණ අධ්‍යයනය කරන්නට වූවාය. හොරණෑවක් මෙන් උල්කොට ගත් සිහින් මුවෙන් හා විමසිලිමත් බවින් යුතුව දරුවාද එක එල්ලේ ඈ දෙස බලා සිටියේය. ඔහුගේ අඩක් විවර වූ දෑස්වල සුදු පැහැයක් දක්නට නොවිණි. එහි වූයේ ගැඹුරු නිල් පැහැයකි. දරුවන් ජානමය වශයෙන් සමාන වුවද ඔවුන් අතර සුළු හෝ වෙනස්කමක් තිබෙනු ඇතැයි ඇය හා පැට්‍රික් බලාපොරොත්තු වූහ. ඔවුන් තනි පුද්ගලයින්ය. *ලස්සන කොල්ලො*

www.musesbooks.com

Copyrighted Material



දෙන්නෙක්, තරමක සෙල්ලක්කාර බවක් මවාගනිමින් ඇය සිතුවාය. *දැන් මට නිදාගන්න පුළුවන්ද? මං නිදි කියලා කාටහරි තේරෙයිද? ඇත්තටම ඒක කාටහරි පෙනෙයිද?*

"රයිලි," එක් අතකින් ලෝරන්ගේ මුහුණ මෘදුව පිරිමදින අතරම ඇඟිල්ලක් දරුවාගේ මුහුණ දිගේ ගෙනයමින් පැට්‍රික් කීවේය. "කොහොමද?"

ලෝරන්ට පීඩාවක් දැනිණි. ඈ සිතා සිටියේ, දින කිහිපයකට පසු, ඔවුන්ව හොඳින් හඳුනාගත් පසු නම් තැබීමටය. එතරම් බරපතළ තීරණයක්! ඔවුන්ට වැරදුණොත් කුමක් වනු ඇතිද?

"රයිලි?" ඇය විමසුවාය. "මම හිතුවේ..."

පැට්‍රික් හිස එසවීය. ඒ වන විටත් ඔහු සිටියේ තම දුරකතනය අතේ තබාගෙනමය.

"අනිත් එක්කෙනාට මොකක්ද කියන්නෙ? රූපට්?"

*රූපට්?* ඒ නම ඔවුන්ගේ ලයිස්තුවේවත් තිබුණේ නැත. ඈ වල්මත්ව සිටින වෙලාවක, ඖෂධ ගොන්නක් ශරීරගත කර ඇඳේ වැතිර සිටින අතරතුර, පපුවෙන් පහළ සිරුර අප්‍රාණිකව ඇති මොහොතක, යෝජනාවක් කළ නොහැකි තරම් දුර්වල අවස්ථාවක ඔහු ඇයව අබිබවා යමින් දරුවන්ට නම් තැබීමට උත්සාහ කරමින් සිටින බවක් පෙනේ. එය සාධාරණ නැත.

"නෑ," තරමක් උස් හඬකින් ඇය කීවාය. "එයාට මෝගන් කියමු."

පැට්‍රික්ගේ ඇහිබැම ඉහළ නැංවිණි. ළමා රෝග විශේෂඥයකු විසින් පරීක්ෂාවට භාජනය කෙරෙන මෝගන් ලෙස නම් කළ දරුවා දෙස ඔහු නෙත් හෙළුවේය. "ඇත්තටමද?" ඔහු සිය දුරකතනය ආපසු සාක්කුවට දමාගත්තේය.

◇ ◇ ◇ ◇

"ඔයාට ගොඩක් වෙලා ඉන්න බෑ," ඇඳ නිවැරදිව ස්ථානගත කිරීමෙන් පසු වින්නඹු හෙදිය පැට්‍රික්ට දැනුම් දුන්නාය. නිල් මුසු කොළ පැහැ තිර රෙදි පසෙකට කෙරුණු අතර, ඊට විරුද්ධ වන්නට ලෝරන්ට වුවමනා විය. සිය සැමියාව වාට්ටුවෙන් ඉවත් කිරීමට පෙර දරුවන්ට මඳක් හුරුවීමට කාලයක් ලැබෙනු ඇතැයි කියා බලාපොරොත්තුවක් ඇයට තිබිණි.

www.musesbooks.com

Copyrighted Material



ශල්‍යාගාරයේ සිට මාතෘ වාට්ටුව දක්වා වූ කොරිඩෝව දිගේ ගමන මීටර් සිය ගණනක් දුර විය. සමහර විට දහස් ගණනක් වන්නට ඇත! පැට්‍රික් නිවුන් දරුවන්ගෙන් අයෙක් සිටි ළදරු කරත්තය තල්ලු කරගෙන ආවේය. අනෙක් දරුවාව තුරුලු කරගෙන සිටි ලෝරන් වැතිර සිටි ඇඳ හෙදිය විසින් ගෙන එනු ලැබීය. කහ පැහැ විදුලි බුබුළු දැල්වූ කොරිඩෝව දිගේ වූ ගමන කිසිදු කතාබහකින් තොර විය. මුලදී ලෝරන් සිතුවේ හෙදිය සමඟ මාරුවී, වඩාත් බරැති කටයුත්ත භාරගනිමැයි යෝජනා කිරීමට පැට්‍රික්ට හැකියාව තිබුණු බවය. නමුත් ඔහු එවැන්නක් නොපැවසීම පිළිබඳව ඇයට ඉක්මනින්ම සතුටක් දැනිණ. වාට්ටුවට පැමිණෙද්දී තමා කරන දේ පිළිබඳව හෙදියට හොඳ අවබෝධයක් තිබුණු බව පැහැදිලි විය. පැට්‍රික්ගේ උසින් අඩක් තරම වූ ඇය වංගුවකින් හැරීමේදී හා ප්‍රවේශ මාර්ගයට ඇතුල් කිරීමේදී ඇඳ සමතුලිතව පවත්වා ගැනීමට තමාගේ මුළු සිරුරේම ශක්තිය යොදාගත්තාය. ඉන්පසු ඇය සිත්ගන්නා ආකාරයෙන්, හිස්ව පැවති කුටි හතරෙන් එකකට, කවුළුවක් අසල තිබුණු කුටියට, රුවල් නැවක් මෙන් ඇඳ තල්ලු කළාය. ඇඳ ඉහත්තාව සෙමෙන් බිත්තියේ වදිද්දී මතුවූයේ එකම එක මෘදු 'ක්ලන්ග්' හඬක් පමණි. පැට්‍රික් එය කළේ නම් කිසියම් වටිනා දෙයක ඇඳ හැපෙනු ඇත.

ඇඳේ රෝදවලට තිරිංග යෙදූ හෙදිය, "ඔන්න අපි ආවා." යැයි පැවසුවාය. ඉන්පසු ඇඳට විරුද්ධ දෙසින් තිබුණු ඔර්ලෝසුව පෙන්වමින් "මිනිත්තු පහළොවයි," යැයි පැට්‍රික්ට අනතුරු හඟවන්නටද අමතක නොකළාය.

වාට්ටුව දිගේ ඇදීයන ඇගේ පියවර හඬ කෙමෙන් මැකී ගියේය. ලෝරන් හා පැට්‍රික් දරුවන් දෙස බැලූහ.

"ඔයා ළඟ ඉන්නෙ කවුද?" පැට්‍රික් විමසුවේය.

ලෝරන් තම තුරුල්ලේ නිදාසිටින දරුවාගේ සියුමැලි අතේ මැණික්කටුව අසල අමුණා ඇති, නම සඳහන් කළ කුඩා පතුර හැරවූවාය. ඒ මත නිල් පැහැ අකුරුවලින් *ටැන්ටර් බබා #1* ලෙස සඳහන් කර තිබිණි.

"මෝගන්," ලෝරන් කීවාය.

අනෙක් දරුවා සිටි ළදරු කරත්තය වෙත පැට්‍රික් පහත් විය. කල්යත්ම දරුවන් ඔවුන්ගේ පියා බඳුම යැයි සෑම අයෙක්ම පවසනු ඇත. නමුත් මේ මොහොතේ නම්, මේ මනාව වැඩුණු

www.musesbooks.com

Copyrighted Material



පුද්ගලයාගේ සහ නටුවෙන් ගිලිහුණු ළදරු කැකුළු බඳු බිලිඳුන් අතර එකදු සමානකමක් හෝ ඇයට පෙනුණේ නැත. කොලු පැටවුන් දෙදෙනා අනිවාර්යයෙන්ම එකිනෙකාට සමාන වනු ඇත. - එකම කරලකින් ගැලවුණු මුං ඇට දෙකක්. නැතිනම් එකම මුං ඇටය දෙවතාවක් - රයිලිට ඔහුගේ සහෝදරයාට සමාන රැලි වැටුණු කුඩා මුහුණක්, සමාන දිගු ඇඟිලි හා අසාමාන්‍ය පරිපූර්ණ නියපොතු තිබිණි. ඔවුන් ඇනුම් හරින විට මුහුණින් සමාන ඉරියව් නිරූපණය විය. තමා හා පැට්‍රික් දරුවන් වෙනුවෙන් රැගෙන ගිය ඇඳුම් අතර තව කොතෙකුත් වර්ණවල ඇඳුම් තිබුණද ලෝරන්ව මඳක් නොරිස්සුමට පත්කරවමින් සැත්කම් කාමරයේ සිටි කිසියම් අයෙක් දරුවන් දෙදෙනාටම අන්දවා තිබුණේ එක හා සමාන සුදු පැහැ ඇඳුම්ය. ඈ සිතාගෙන සිටියේ එක් අයෙකුට කහ පැහැ ඇඳුමක් ඇන්දවීමටය. නම සඳහන් පතුරු නොවී නම් බොහොම පහසුවෙන් ඔවුන් එකිනෙකා පැටලෙනු ඇත. එසේ පැටලුණද ඒ බව දැනගත හැක්කේ කාටද? නම් පතුරුවලට ස්තුතියි. ඇගේ දෑතේ රැඳී සිටි මෝගන් හිස එහා මෙහා සොලවමින් දෑස අඩක් විවර කළේය. ඒවා ආපසු සෙමෙන් වැසෙන අයුරු ඇය බලා සිටියාය.

දරුවන් දෙදෙනාටම නිදාගැනීමට ඔවුන් සපයා තිබුණේ එක් ළදරු කරත්තයකි. රයිලි පැට්‍රික්ගේ බැල්ම යටතේ, ළදරු කරත්තයේ ඉහළ සවිකළ විනිවිද පෙනෙන ප්ලාස්ටික් තට්ටුව මත වැතිර සිටියේය. බිලිඳාට යටින්, තදින් හිරවුණු මෘදු මෙට්ටයක් විය. මෙට්ටය දෙකෙළවර රෝහලේ නම මුද්‍රිත, නැවූ ළදරු පොරෝනා දෙකක් තබා තිබිණ. එය රැඳවූ කරත්තයේ හැඩයට වඩා තොටිල්ලේ හැඩය වෙනස් විය. ප්ලාස්ටික් තට්ටුව හා මෙට්ටය බොහෝ පළල්ය. බිලිඳා නිදාසිටියේ බියට පත් වූ විට ගුළිගැසෙන කම්බිලි පණුවෙක් මෙනි. පැට්‍රික් අනපේක්ෂිත ලෙස ළදරු කරත්තය මඳක් සොලවද්දී රයිලිගේ දෑත් හා දෙපා පස්කොන් තරුවක හැඩයට විහිදිණි. ඉන්පසු සිය සහෝදරයා දෑස වසාගත් වේගයෙන්ම නැවත හැකිළෙමින් ගෝලයක් බවට පත් වූ රයිලි, තොටිල්ලේ ඔහුගේ පස නිදන්නට විය. *චූටි බබෙක්ව වඩාගන්න චූටි කුරුලු කූඩුවක් වගේ වටකුරු හැඩයට අත් දෙක තියාගන්න ඕන. මීට කලින් කවුරුත් ඒ ගැන හිතුවේ නැත්තෙ ඇයි?* ලෝරන් සිතුවාය.

"හලෝ රයිලි," පැට්‍රික් කීවේ අමුතු හඬකිනි. ඔහු සිරුර කෙළින් කරගත්තේය. "එහෙම කතාකරන එක හරිම අමුතුයි."

www.musesbooks.com

Copyrighted Material



ඒ දෙසට නැමුණු ලෝරන්, කුඩා බෝලය නොපෙරළෙන සේ ප්‍රවේශමෙන් ළදරු කරත්තය සිය ඇඟ අසලට ඇදගෙන, බිලිඳා එහා මෙහා නොයන ආකාරයෙන් ඔහු හා මෙට්ටය අතරට පොරෝනාවක් යට කළාය.

"හලෝ රයිලි," ඇය බිලිඳා ඇමතුවාය. "ඔව්. ඒක ටිකක් අමුතුයි වගේ. ඒත් මට හිතෙන්නෙ අපි ඒකට ඉබේම හුරුවෙයි." ඇ තම අතේ සිටි බිලිඳා දෙසට හිස හැරවීය. "හලෝ මෝගන්," ඇය කීවාය. ලෝරන් තවමත් බලා සිටියේ ආදරයේ ප්‍රහාරය වෙනුවෙනි. ඔවුන් ඉපදුණු තත්පරයේ සිට දැනෙන, මීට පෙර කිසිදා අත්විඳ නොමැති ආකාරයේ හැඟීම. දරුවන් සිටින මිනිසුන් නිරන්තරයෙන් දරා සිටින ආදරයේ ආක්‍රමණය. එවැන්නක් තමාට දැනෙන තෙක් ඇය බලා සිටියාය. තමාට තවම එය දැනුණේ නැතැයි ඈ කම්පා වූවාය.

ඇය මෝගන්ව පැට්‍රික් අතට දුන්නාය. ඔහු බිලිඳා වඩාගෙන සිටියේ, ආපසු තැබීමට අවශ්‍ය වුවත් අනතුරක් සිදුවේ යැයි බියෙන්, කොතනක තැබිය යුතුදැයි අවිශ්වාසයෙන් යුතුව අතේ තබාගෙන සිටින නිවසටත් වඩා වටිනා, ආකර්ෂණීය, පෞරාණික පිඟන් භාණ්ඩයක් ආකාරයෙනි. එම හාස්‍යජනක ඉරියව්ව දෙස ලෝරන් මහත් ඕනෑකමින් බලා සිටියාය. මේ දේවල් සම්බන්ධයෙන් අවබෝධයක් තිබුණාක් මෙන් එක්වරම දරුවා හඬන්නට පටන්ගත් විට සන්ත්‍රාසයට පත් කාටූන් රූපයක් මෙන් පැට්‍රික් ගල්ගැසුණේය. මෝගන්ගේ හැඬුම රයිලිවද අවදි කරවා හැඬවීමට සමත් විය.

"එයාව එතන තියන්න, රයිලි ළඟ," ලෝරන් කීවාය. නිවුන් දරුවෝ ඔවුන්ගේ ජීවිත කාලය පුරාවටම එකට රැඳුණහ. පසුකාලීනව එය ඔවුන්ට කෙසේ බලපානු ඇතිදැයි ඇය කල්පනා කළාය. මාස නවයක් පුරාවට ඔවුහු ඈ තුළම වැඩෙමින් ඈ සමඟ සිටියහ. එකී මුළු කාලය පුරාවට සෑම දිනක්ම, සෑම තත්පරයක්ම ඔවුන් තිදෙනා කාලය ගතකළේ එකටමය. ඔවුන් තවදුරටත් තමා තුළ නොවීම පිළිබඳ ඇයට සහනයක් දැනිණි. ඒ වහාම සහනය පිළිබඳ වරදකාරී හැඟීමක්ද, ඇගෙන් ඉවතට තැබෙන පළමු පියවර, පසුකාලීනව නොවැළැක්විය හැකි පියවරයන්ගේ පළමුවැන්න, ඔවුන් තබා තිබීම පිළිබඳව විශාල අහිමි වීමේ වේදනාවක්ද ඇයට දැනිණි. එම වරදකාරී හැඟීම ආදරයද? එම අහිමිවීමේ සංවේදනය ආදරයද? අනිවාර්යයෙන්ම එසේ නොවේ.

www.musesbooks.com

Copyrighted Material



කෑ ගසා හඬන මෙම පොඩි දෙක මුහුණට මුහුණ බලාගෙන සිටින සේ පැට්‍රික් එකිනෙකා අසල තැබුවේය. ආශ්චර්යයකි! හැඬීම නතර විය. ඔවුහු දෙදෙනාම තමා සමීපයෙන් සිටි, එකිනෙකාගේ මෘදු කෙස් සහිත හිස වටා සිඟිති අත් පටලාගත්හ. මෝගන් සිටියේ රයිලිගේ කනකින් අල්ලාගෙනය. සෑම දෙයක්ම සන්සුන් විය. ඉහළ සිට බලන විට ඔවුන් පෙනුණේ මායාවක් මෙනි. අසම්භාව්‍ය දෙයක්. ලෝරන් නැවතත් තම සිත පරීක්ෂා කළාය. නමුත් ඇයට වැටහෙන තරමට තවම ඈ තුළ ආදරයේ ආක්‍රමණය මතුවී නැත.

නවය පසුවන විටම වාට්ටුව වෙත ආපසු පැමිණි කෲර හෙදිය, තවමත් හිරිවැටුණු දෙපා ඇති, සෙලවෙන්නටවත් නොහැකි ලෝරන්ව අලුත උපන් දරුවන් දෙදෙනෙකුගේ සෑම ආකාරයකම වුවමනා එපාකම් සමඟ ගනුදෙනු කිරීමට තනි කරමින් පැට්‍රික්ව ආපසු නිවෙස වෙත එළවා දැමීමට පටන්ගත්තාය.

"ඔයාට මාව දාලා යන්න බෑ," ලෝරන් කීවාය.

"ඔබට මෙතන ඉන්න බෑ," හෙදිය කීවාය.

"මම ආපහු එනවා," පැට්‍රික් කීවේය. "ඉස්සෙල්ලාම. එයාලා දොරවල් ඇරපු ගමන්ම. බයවෙන්න එපා."

ඔහු ඇගේ හිස හා කුඩා දරුවන් දෙදෙනා සිපගත්තේය. ඉන්පසු මඳක් කලබලයකින් මෙන් පිටතට ගියේය.

MusesBooks®

www.musesbooks.com

Copyrighted Material



# 02

පැට්‍රික් පිටවගිය පසු මොරගෑමක් ඉක්මනින් පැමිණීමට නියමිත බව දැන සිටි ලෝරන්, වියළුණු දෑසින් යුතුව නිහඬව වාඩිවී බලා සිටියාය. එසේ වුවත් මේ මොහොතේ නම් ඔවුන් සිටියේ නින්දේය. සුදු පැහැයෙන් එතු කෝෂයන් බඳු නිවුන් බිලිඳුන් දකින විට ඈට දැනුණේ තම දෑස් ඇදහිය නොහැක්කාක් මෙනි. *මම ඇත්තටම ඒක කළාද?*

රෝහල නිහඬ වූයේ නැත. ජනේල කළු පැහැ වීදුරුවලින් සකස් කර තිබුණද එහි අඳුරක්ද නොවීය. ලෝරන්ගේ පිළිබිඹුවේ ඇස් තිබිය යුතු තැන පෙනුණේ, සෙවණැලි සහිත ගැඹුරු කුහර දෙකක් ලෙසිනි. එය බියජනක රූපයකි. ඇය ඉවතට හැරුණාය.

විවිධ මුනු මුනු හඬ කිහිපයකින් සැදුණු හුම්කාරයක් ගොඩනැගිල්ල පුරා පැතිර තිබිණි. එය නොනවතින, හැඟීම් විරහිත තානයකි. සිය කොට්ටය මත හිස තබද්දී එහි එක් ගායකයෙක් තම ඇඳ බව ලෝරන්ට වැටහිණ. එය බොහෝදුරට උණුසුම්කරණ උපකරණය නිසා නැගෙන වඩාත් ප්‍රබල වූ හුම් හඬට අනුව තරමක් පහත් හඬින් විෂම ලෙස මතු වූ අනුනාදයකි. ඇගේ ඇඳ අසල වන ලාම්පුවෙන්ද සිහින් හඬක් නිකුත් විය. එයින් නැගුණේ සන්සුන් බවක් දැනෙන ගුමු ගුමුවකි. ලාම්පුවේ දීප්තිමත් ආලෝකය ඇගේ ඇසිපියන් විනිවිදිමින් අකුණු පහරක් මෙන් ගලා එද්දී තවමත් වාඩිවූ ඉරියව්වෙන්ම සිටි ලෝරන් දෑස වසාගත්තාය. ඇය තුන් හතර වතාවක්ම ගැඹුරු හුස්ම ගනිමින් පහත හෙළුවාය. ඈ දිගු කාලයක් බලා සිටි නින්ද ඒ වෙත පැමිණෙමින් තිබිණ.

එක් බිලිදෙකුගෙන් නික්මුණු කෙඳිරිල්ල ඇගේ අඩ නින්ද හරහා ශාරීරික වේදනාවක් ලෙස මතුවිය. ඈ තම දෑස විවර කිරීමට

www.musesbooks.com

Copyrighted Material



ආයාසයක් දැරූ නමුත් ඇසිපිය සලන සෑම වතාවකම ඇයට පෙනුණේ, සිය ඇහිපියන් තුළ රතු පැහැ පසුබිමක ඇති අඳුරු රේඛා මෙන් දිවෙන රුධිර නාලිකාවල සිතියමක් දෘෂ්ටි විතානය මත පතිතව ඇති ආකාරයක් පමණි. හඬක් නැගෙන තරම් වේගයෙන් ඇය ලාම්පුව මුහුණ ඉදිරියෙන් ඉවත් කළාය.

*සමහරවිට එයාට ආපහු නින්ද යන්න ඇති,* ශුභවාදය තුළ අතරමංවෙමින් ඇය සිතුවාය. රයිලිගේ කෙඳිරිල්ල 'ක්ලක්' හඬක් බවටද, ඉන්පසු 'ක්ලක් ක්ලක් ක්ලක් වාආආ...' බවටද පත්විය. එවිට ඈ වහා ක්‍රියාත්මක විය යුතු විය. හඬන එක් බබෙක් ප්‍රමාණවත්ය.

ඈ ළදරු කරත්තය හැකිතාක් තමා වෙත ඇදගත් නමුත් තමාට ඔහුව එසවිය නොහැකි බව ඇයට වැටහිණ. ලෝරන් පසෙකට නැමෙද්දී, ඒ වන විට සිය සිරුරේ නොවැදගත් බවට පත්ව තිබුණු හිරිවැටී ඇති පහළ කොටස ඇඳෙන් බිමට නොවැටී රඳවාගැනීමට එක් අතක් අවශ්‍ය විය. නමුත් ඇයට පෙන්වාදී තිබූ ආකාරයට බිලිඳෙකු එසවීමේදී එක් අතක් හිස යටිනුත් තව එකක් සිරුර යටිනුත් දැමීමට නම් අත් දෙකම අවශ්‍යය. රයිලිගේ මුව විවරව, ඇස් තදින් පියවී, දෙපා දිගහැරී තිබිණ. ඔහුගේ දෑත පිටතට දිගුවී, අවකාශය තුළ නොමැති යමක් සොයා එහා මෙහා සෙලවෙන්නට විය.

ගර්භාශය පිළිබඳවත් එය ඔවුන් දෙදෙනාවම දරාගෙන, පෝෂණය කරමින් ඔවුන්ව උණුසුම් කළ ආකාරය පිළිබඳවත් ලෝරන් කල්පනා කළාය. ඇයට ඔවුන් ගැන අනුකම්පාවක් ඇති විය. ස්වභාවධර්මයා දරුවන්ව ඔවුන්ගේ ආදරණීය නිවසින් ඉවත්කර ඈ වෙත බාරදී ඇත. ඔවුන්ව ඇගේ දරුගැබෙන් පිටතට ගෙන ඈ අත රඳවා ඇත. ඔවුන් හා විස්මෘතිය, ඔවුන් හා අසමර්ථය, ඔවුන් හා බලාපොරොත්තු බිඳවැටීම අතර සිටි එකම පුද්ගලයා ඈ පමණි. ඇගේ ජීවිතයේ ඒ මොහොතේ තිබුණු එකම බලාපොරොත්තුව වන තම දරු පැටියාව අතට ගෙන ඔහුගේ කුඩා කුස පිරවීම කළ නොහැකිව ලෝරන් ළතවෙමින් සිටියාය.

සිය සහෝදරයාගේ හැඬුම මෝගන්ටද ඇසෙන බව පෙනිණි. ඔහු සිටියේ අඩනින්දේය. නමුත් ඉක්මනින්ම ඔහුද සම්පූර්ණයෙන්ම අවදි වනු ඇත. ඔවුන් දෙසට නැමුණු ලෝරන්, රයිලිගේ නිදන ඇඳුමේ ඉදිරිපසින් අල්ලාගෙන ඔහු එතුළ සිරවී පොට්ටනියක් වන සේ ඇඳුම තදකර රඳවාගත්තාය. ඔහුව තම උකුළ වෙත ගන්නා තත්පර කිහිපය තුළදී ඔහුගේ හිස පහතට නැවී, සවිමත් නොවූ

www.musesbooks.com

Copyrighted Material



ගෙල කඩාවැටෙනු ඇතිදැයි බියෙන් යුතුව හුස්මක් අල්ලාගත් ඇය තනි අතෙන් ළදරු පොට්ටනිය එසවූවාය. නමුත් මීට පැය දෙකකට පෙර ප්‍රසූතියේදී ලෝහමය අඬුවලින් අල්ලා දැඩි බලයක් යොදමින් පිටතට ඇද්දේද මේ හිසම බව ඇයට සිහිවිය. පහසුවෙන් බිඳෙනසුලු හා සියුමැලි ලෙස පෙනුණද එය සිරුරේ ඉතිරි කොටස්ද ආරක්ෂිතව පිටතට රැගෙන ආවේය.

ඈ රයිලිගේ කුස පිරවීමට වෙහෙසෙන අතර මෝගන් සම්පූර්ණයෙන්ම පිබිදී කුසගින්නේ හඬන්නට විය. තමාට අක්‍රිය කළ නොහැකි තැතිගන්වනසුලු එම හඬ ඇය අසරණ ලෙස අසා සිටියාය. එම වැලපීම ඍජුවම ඇගේ ශරීරයට සම්බන්ධ වී, ඇගේ මොළයේ සියලු ඉඩකඩ අවුරමින් පැතිරිණි. ඒ අනුව දරුවාව සැනසවීම සඳහා, ඔහුගේ හැඬුම නතර කිරීම සඳහා අත්‍යවශ්‍යයෙන්ම කළ යුතු වන ඔහුගේ කුස පිරවීම හැර අන් යමක් ගැන ඇයට කල්පනා කළ නොහැකි විය. කැලඹිලිකාර මිනිත්තු කිහිපයකට ඇයට වැටහුණේ තමා රයිලිගේ මුව කෙළවරට සුළැඟිල්ල රිංගවමින්, ඔහුව තන පුඩුවෙන් ඉවත් කරමින් සිටින බවයි. දොඹකරයකින් ඔසවන්නාක් බඳුව එක අතකින් අසීරුවෙන් රයිලිව ඔසවා, ඔහුව කුසගින්නේ පෙළෙන සිය සහෝදරයා සමීපයෙන් තැබීය. මඳ වේලාවක් යන තෙක් එහි වූයේ කුඩා තොල් පෙති තලුමරන හඬක් වූ නමුත් එය පැවතුණේ තමාගේ ආහාරවේල අවසන් නොකළ බව රයිලිට සිහිවන තෙක් පමණි. ඔහුගේ හදවත බිඳීයනු ඇතැයි ඇයට සිතිණි.

ඒ අනුව එක් බිලිඳෙකු කිරි ඉල්ලා හඬන අතර ඇය අනෙක් බිලිඳාට කිරි දුන්නාය. මෙහි අවසානයක් තිබිය යුතු යැයි සිතමින් ඇය සිසිෆස්[1] මෙන් දිගින් දිගටම මෙය සිදුකළ නමුත්, ඇයට හැඟුණේ එහි නිමාවක් නැති බවකි. ඈ උපකාරයක් බලාපොරොත්තුවෙන් සීනුව නාද කළාය. නමුත් එහි පැමිණි වින්නඹු හෙදියගෙන් කෙතරම් පීඩාවට පත් බවක් නිරූපණය වූයේද යත්, යළිත් වතාවක් ඇයට අමතන්නේ නැතැයි ලෝරන් ක්ෂණිකව තීරණය කළාය. දරු ප්‍රසූතියෙන් පසු විවේක ගැනීමට හා ගිලිහුණු ශරීර ශක්තිය නැවත උපදවා ගැනීම වෙනුවෙන් නිදාගැනීමට ඇගේ බිඳීගිය මොළය

1 *Sisyphus* - සිසිෆස්. ග්‍රීක මිථ්‍යා කතාවක සඳහන් වන රජ කෙනෙකි. කොරින්තියේ විසූ මසුරු රජෙක් වූ ඔහුට, මරණින් මතු ලෝකයේ ප්‍රධානියා වන හේඩීස්ගෙන් ලද දඬුවම වූයේ සෑම විටකම ආපස්සට පෙරළෙන බරැති ගලක් කන්දක ඉහළට තල්ලු කිරීමය. කතාවට අනුව අවසානයකින් තොරව ඔහු දිගින් දිගටම මෙය සිදුකරන්නේය

www.musesbooks.com

Copyrighted Material



උත්සාහ කරද්දී රාත්‍රිය ඇදෙමින් ඉදිරියට පනින්නට විය. දහවලක්, රාත්‍රියක් සහ දහවලක් නොනිදා සිටි ඇයට දරුවන් එසවීම, එහා මෙහා කරවීම, කිරි දීම සඳහා වේදනා දෙන ඉරියව්වල මිනිත්තු ගණන් වාඩිවී සිටින මෙම දිගු රාත්‍රියේද නින්ද අහිමිව ඇත. ඇගේ කොන්ද කනිපින්දම් නගන්නට විය. ඇගේ බාහුවේ මාංසපේශි ඉරී තිබිණ. පිපිරී රුධිර බිඳු ගලන ඇගේ පියයුරු තුඩුවලින් වෑහෙන ක්ෂීරය ඇගේ බිලිඳාගේ පියවුණු තොල් අතරින් ගලා ගියේය. ඉන්පසු ඇයට දුන් එන්නතේ බලය සිඳීයන විට ඇගේ හානියට පත් ශ්‍රෝණියෙන්, ඔවුන් කැපුමක් යොදා නැවත මසන ලද, ඉරෙන තරම් ඇදුණු ඇගේ ශ්ලේෂ්මල පටලයෙන් වේදනාවක් දැනෙන්නට විය.

තමා නින්දට වැටුණේදැයි ඇයට අවබෝධයක් නොවීය. ලෝරන්ට දැනුණේ තමා නිදා නොගත් බවකි. එසේ වුවත් බිලිඳෙකු ඉතා සෙමෙන් තොටිල්ල මත තබා, එක්වරක් ඇසිපිය සලා දෑස විවර කර බලන විට පැයක් පමණ ගතවී ඇති බව ඇයට පෙනිණි.

ඇගේ ඇඳ තිබුණු කොටස හා යාබද කොටස අතර තිර ඇද තිබේ. හෙදිය තවත් අලුත් මවක් ගෙන එන්නට ඇත. ඇගේ බිලින්දෝ දෙදෙනා එකිනෙකා දෙස බලා සිටින පෙරළි කොමා දෙකක් මෙන් නිහඬවම සාමකාමී ලෙස නින්දට වැටී සිටියහ.

තිරයට එහා පැත්තෙන් ඇසුණේ මවක් බිලිඳෙකු හුරතල් කරමින් කතාකරන හඬකි. කලබලකාරී මිමිනීමක් බඳු එම කටහඬ පහත් ස්වරයකින් යුතු විය. එම හඬ අමුතු ලෙස දැනෙන්නේ ඇයිදැයි ලෝරන්ට වැටහුණේ නැත. ඇය තව මොහොතක් එයට ඇහුම්කන් දුන්නාය. කාන්තාවක් සිය බිලිඳාට තේරුමක් නැති දේ මුමුනමින් සිටිනවා පමණි. එය තමාට ගැටලුවක් වන්නේ ඇයි? ඊළඟට බිලිඳාගෙන්ද හඬක් නැඟිණි. එසේ වුවත් බිලිඳු හඬ ඇසුණේ කුරුලු පැටවකුගේ මෘදු හඬලෑමක්, තාරාවකුගේ බඳු හඬක්, ආහාර දෙන මෙන් කෑගසන කුරුලු හඬක් මෙනි. එහි තවත් යමක්, පූස් පැටවකුගේ බඳු තවත් හඬක්ද විය. ලෝරන් ඇස් වසාගෙන අඩ නින්දට වැටුණාය. පූසෙකු හා කුරුල්ලෙකු සමඟ සිටින කාන්තාවක්, නහර ඉලිප්පුණු කෙට්ටු වියපත් කාන්තාවක්, අත් දෙපස උරහිස් මත සතුන් දෙදෙනාව රඳවාගෙන පනිට්ටුවක දැමූ පණුවන්ව ඔවුන්ට කෑමට දෙමින් සිටිනු ලෝරන්ට සිහිනයෙන් පෙනිණි. ඇගේ දෑතම පිරී තිබුණේ පණුවන්ගෙනි. එක් එක් පණුවන්ව ගුලිකර

Copyrighted Material



උගුලට හසුකරගැනීම සඳහා මැහැල්ල යොදාගත්තේ ඇගේ කළු පැහැ දිවයි. කුරුල්ලාගේ හොට හා පූස් පැටවාගේ අයාගත් මුවට දැමීමට පෙර දඟලන, පැටලුණු පණුවන්ව දෙපසට අදිමින් ඇය පැටලිල්ල දිගහැරියාය. පූස් පැටවාගේ තියුණු දත් තුනී සිවියකින් යුත් සත්වයාගේ සම මිරිකන්නට විය. කලබලයෙන් ඇඹරෙන සත්වයා, මවගේ දිගහැරුණු කළු දිව හරහා කුරුල්ලාගේ හා පූස් පැටවාගේ හොට හා හනු අතරට වැටෙන්නට පෙර ජීවිතය බේරාගැනීමට නිරර්ථක උත්සාහයක් දැරුවේය. ඌව ඉරාගන්නා තෙක් සත්තු දෙදෙනාම තෙත මහත පණුවාට පහරදී, දෙකට වෙන් වූ පසු එකිනෙකාගෙන් ඉවතට හැරී තලුමරමින් මුව පුරා ගිල දැමූහ. ඔවුන් පණුවෙකුගේ අඩකින් සෑහීමකට පත්විය. සතුන්ට කෑම දෙන අතරම මැහැල්ල ඔවුන්ට යමක් කියමින් සිටියාය. කිසියම් හදිසි දැනුම් දීමක්. ලෝරන්ට වටහාගත නොහැකි තොරතුරක්. තමා උන්ට පවසන සියල්ල මතක තබාගැනීමේ වැදගත්කම මෙන්ම උන්ගේ ජීවිත ඒ මත රඳා පවතින බව අවධාරණය කරමින් මැහැල්ල කොඳුරන්නට විය. සිහිනය තුළ සිටි සතුන් තමන්ට හැකිතාක් හොඳින් ඇයට ඇහුම්කන් දුන් නමුත් උන්ට තවත් ආහාර අවශ්‍ය වූ බැවින් කෑගැසීය. කෑගසන උන්ගේ හඬ කුරුල්ලෙකුගේ හා පූසෙකුගේ හඬවලින් ඈත්ව ක්‍රමයෙන් මිනිස් දරුවන්ගේ හඬට පෙරළිණි. තාරා හඬ ඇඬීමක් බවටද, පූස් පැටවාගේ ඤාව් හඬ බිලිඳෙකුගේ මෘදු වැලපීමක් බවටද හැරිණි. සිහිනය තුළ සිටි මැහැල්ල සතුන්ව වඩාගෙන උන්ගේ සිරුරුවල හැඩය වෙනස් වන අතරතුර උන්ව නිහඬ කරවීය. අවසානයේ ඔවුන්ගේ මිනිස් සිරුරු මතු වූ පසු ඔවුන්ව මෘදු ලෙස නැළවූ ඇය, ඉතාමත් ප්‍රවේසමෙන් නිවුන් දරුවන්ව රෝහලේ තොටිල්ල මත තැබුවාය.

ලෝරන්ගේ දෑස එක්වරම විවර විය. සිහිනය තවදුරටත් පැවතිණි. නාස් පුඩුවලට සතෙකුගේ ගඳක් දැනෙන්නට වූවෙන් කරදරකාරී රූපවලින් මිදීමට ඇය හිස දෙපසට සැලුවාය. තම බිලිඳුන් හුස්ම ගන්නා හඬ හා යාබද ඇඳේ සිටින අනෙක් නිවුන් දරුවන් දෙදෙනා යාන්තමින් මතුකරන හඬ හැරෙන්නට සියල්ල නිහඬය. යාබද ඇඳේ සිටින කාන්තාවටද නිවුන් දරුවන් ලැබී ඇතැයි දැන් ඇයට සිතෙයි. එමෙන්ම ඒ පිළිබඳව දැඩි විශ්වාසයක්ද දැනෙයි. ඇය ප්‍රවේසමෙන් ඇහුම්කන් දුන්නාය. අනිවාර්යයෙන්ම බිලිඳෙකු හුස්ම ගනියි. එසේ විය හැකි සම්භාවිතාව කොපමණද?

www.musesbooks.com

Copyrighted Material



ඇයට සිහිනය අමතක විය. ලෝරන් ඒ ගැන සතුටු වූවාය. තිරය මැත්කර එබී බලා කතා කරන්නට අවශ්‍ය වූ නමුත් ඇයට ඒ වෙත ළඟාවීමට හැකියාවක් නොවීය. ඒ හැරත් තවම මැදියම් රැයයි. ඈ උදෑසන වන තෙක් බලා සිටිය යුතුය. එකම දිනයක නිවුන් උපත් දෙකක් සිදුවීම. ඇතැම් විට එය රෝහලේ වාර්තාවක් වන්නට ඇත.

කොඳුඇට පෙළට එන්නතක් ලබාදීමෙන් දුර්වලව, නින්ද අහිමි වීමෙන් හා වේදනාවෙන් වෙහෙසට පත්ව සිටින, ඇඳටම හිරවුණු ශරීරයකින් යුතු ලෝරන් තමාවම සනසාගත්තාය. අඩුම තරමේ තමාට දැන් කතා කිරීමට අයෙකු සිටියි. සමාන අත්දැකීමක් විඳින අයෙක්. කවුළුව කෙළවරෙන් එබෙන හිරුගේ පළමුවන කිරණේ රත් පැහැය, වාට්ටුවේ සුදු හා කහ පැහැති විදුලි බුබුළුවලට බෙදා දෙන්නට විය. තිරයට ඔබ්බෙන් සියල්ල නිහඬය. අනෙක් නිවුන් දරුවන්ගේ මව නිදනවා වන්නට ඇත. ලෝරන් නැවතත් දෑස වසාගත්තාය. නමුත් ඇගේ ඇසිපිය එකිනෙක මුණගැසෙත්ම තම බිලිඳෙකු තන පුඩුව සොයමින් සිය කුඩා හිස දෙපසට සොලවද්දී සිඟිති කම්මුල් පොරෝනාවේ ස්පර්ශ වන සිහින් හඬ ඇයට ඇසිණි. බලහත්කාරයෙන් මෙන් දෑස් විවර කරගත් ඇය, සිරුර මඳක් කෙළින් කරගත්තාය. ඉන්පසු බිලිඳාට කිරි දීම සඳහා ඔහුව පොට්ටනියක් ලෙස සකසාගෙන ඉහළට ඔසවද්දී දැතින් මතුවුණු වේදනාවද දරාගත්තාය.

MusesBooks®

www.musesbooks.com